# ඉගෙනුම කෙරෙහි බලපාන පුද්ගල බද්ධ සාධක

කුඹුකන්දන රේවත හිමි

ඉගෙනුම යනු පුහුණුවක හෝ අනුභූතියක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන චර්යාමය, කුසලතාමය හෝ දැනුමේ වෙනසකැයි සැලකේ. මෙම කුමන හෝ අංශයක වෙනස සිදුවීමෙහිලා බලපාන සාධක හා ඉගෙනුම කෙරෙහි තත් සාධක බලපාන ආකාරය හඳුනාගැනීම මේ ලිපියේ අරමුණ යි. පුද්ගල බද්ධ සාධක යනු ඉගෙනුම්කරු හෝ ඉගෙනුම සිදුකරන පුද්ගලයා හෙවත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සම්බන්ධ සාධකයන් ය. ඉගෙනුම සම්බන්ධයෙන් එය සිදුවන සන්දර්භයෙහි හා ඊට සම්බන්ධ පුද්ගලයන්ගේ බලපෑම වැදගත් කොට සලකනු ලැබේ. මෙහිදී ඉගෙනුම්කරු (ශිෂ්‍යයා) ද ඉගෙනුම කෙරෙහි විශේෂයෙන් මැදිහත් වන බව පෙනේ. ඉගෙනුම්කරුගෙන් තොර ව "ඉගෙනුම" සිදු නො වේ. එලෙසට පුද්ගල බද්ධ සාධක ලෙස සැලකෙන සාධක කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

1. අභිප්‍රේරණය
2. පැහැදිලි කිරීමේ ශෛලිය
3. හැකියා මට්ටම
4. සෞඛ්‍ය තත්ව
5. පරිණතිය
6. පෞරුෂය
7. ලිංගික භාවය



8. වයස
9. ආකල්ප
10. ස්වසංකල්පය
11. කැමැත්ත

ඉගෙනුම කෙරෙහි මෙම සාධක බලපාන ආකාරය වෙන් වශයෙන් හඳුනාගැනීම මින් ඉදිරියට සිදුකෙරේ.

## 1. අභිප්‍රේරණය

"අභිප්‍රේරණය" (Motivation) යනු චර්යාව ශක්තිමත් කරන, දිශාගත කරන හා පවත්වන ක්‍රියාවලිය යි. මීට "ප්‍රබෝධනය" යැයි ද කියනු ලැබේ. එය සිසුන් ව අධ්‍යයන කටයුතු කෙරෙහි යොමු කරමින්, දිශාවන් දක්වමින් අධ්‍යයන චර්යා දිගට පවත්වයි. ළමුන්ගේ අභිප්‍රේරණය එකිනෙකාට වෙනස් ය. සමහරු පන්තියේ වැඩ කටයුතු තනි ව කිරීමට කැමැති වෙද්දී තවත් සමහරු සාමූහික වැඩ කටයුතුවලට කැමැත්තෝ ය. තවත් සමහරු පාඩම් වැඩවලට වඩා ක්‍රීඩාවන්ට යොමු වෙති. මේ සියල්ල අභිප්‍රේරණයේ විවිධත්වයේ ප්‍රතිඵලයන් ය. අභිප්‍රේරණය සිසුන්ගේ ශක්තිය වැඩි කරයි. ඔවුන්ගේ ඉලක්ක කරා යෑමේ ධෛර්යය තීරණය කරයි. මනෝවිද්‍යාඥයන්ට අනුව අභිප්‍රේරණයේ ආකාර දෙකකි. එනම් අභ්‍යන්තරික අභිප්‍රේරණය (Intrinsic Motivation) හා බාහිර අභිප්‍රේරණය (Extrinsic Motivation) වශයෙනි. අභ්‍යන්තරික අභිප්‍රේරණය සහිත සිසුන් අභිප්‍රේරණය වනුයේ, අභ්‍යන්තර සාධකවලිනි. එනම් ඔවුන් විසින් කරනු ලබන කාර්යන් වටිනා බවට සංජානනය කිරීමෙනි. බාහිර අභිප්‍රේරණයක් සහිත සිසුන් බාහිර සාධකවලින් අභිප්‍රේරණය වේ. අභිප්‍රේරණය වැඩි වන විට ඉගෙනුම ද වැඩි වේ.

## 2. කැමැත්ත

කැමැත්ත හා රුචිකත්වය (Interest) වැනි මානසික තත්ත්වයන් ඉගෙනුම කෙරෙහි අත්‍යන්තයෙන් බැඳී පවතී. ඉගෙනුම කැමැත්තෙන් කිරීමට ලැබීමෙන් ඒ සඳහා වැඩි කාලයක් යෙදවීමට හා වැඩි කැපකිරීමක් කිරීමට හැකි වේ. සිසුන්ට ඔවුන් කැමති විෂයන්, කැමති ගුරුවරුන් හා කැමති ස්ථාන ආදිය මෙන් ම අකැමති විෂයන්, අකැමති ගුරුවරුන් හා අකැමති ස්ථාන, අකැමති ඉගෙනුම් ක්‍රම ද පවතී. කැමැත්ත යනු යමක නිරතවීම පිළිබඳ මනෝවිද්‍යාත්මක තත්වය කි. කැමැත්ත ද අභ්‍යන්තර අභිප්‍රේරක සේ ක්‍රියා කරයි. කැමැත්ත ඉගෙනුම සම්බන්ධ වැදගත් විචල්‍යයක් වුව ද සිසුන්ගේ රුචිකත්වය වර්ධනය කිරීමේ දී ගුරුවරුන් තමන්ට ඇති ශක්තිය හඳුනාගෙන නැති බව මනෝවිද්‍යාඥයන්ගේ අදහස යි. ගුරුවරුන් තම ඉගැන්වීමේ උපකරණ ව්‍යුහගත කරන ආකාරය සිසුන්ගේ රුචිකත්වය වර්ධනයට වැදගත් වේ. සිසුන්ගේ බුද්ධිමය හා චිත්තවේගික අවශ්‍යතා සැපිරීමට කැමැත්ත හෝ රුචිකත්වය අවශ්‍ය වේ.

කැමැත්ත යමක් සංජානනය කිරීම සඳහා අවශ්‍ය වන සූදානම ඇතිකරයි. සාර්ථක ඉගෙනුමට කැමැත්ත අවශ්‍ය කෙරේ. එමෙන් ම එමගින් ඉගෙනුම සඳහා මූලික පදනම සැපයීම ද සිදුවේ. කැමැත්ත අවධානය කෙරෙහි ද අවධානය සංජානනයට ද බලපායි. කැමැත්ත ඇති විට කෙනෙකුට ඉතා අසීරු අවස්ථා යටතේ වුව ද ඉගෙනුම කළ හැක. ඉගෙනුම ආරම්භ කිරීමට පෙර කැමැත්ත උද්දීපනය කළ යුතු ය. කැමැත්ත ඇතිකිරීමට විවිධත්වයෙන් යුතු ක්‍රියාකාරකම් උපකාරි වේ.

## 3. හැකියා මට්ටම

ඉගෙනගනු ලබන පුද්ගලයාගේ බුද්ධිය, නිර්මාණශීලිත්වය හා අභියෝග්‍යතා ආදියෙහි මට්ටම මෙයින් අදහස් වේ. බුද්ධිය අඩුකම පාසැල් වැඩ කටයුතුවල දුෂ්කරතා ඇතිකරයි. එමෙන් ම



නොහැකියාවන් සහිත සිසුන්ට ඉගෙනීම කළ නො හැක. සමහර සිසුන් යම් විෂයකට වැඩි ලකුණු ගනිද්දී තවත් විෂයකට අඩු ලකුණු ලබාගැනීම ද දක්නට ලැබේ. එවැනි අවස්ථාවන්ගෙන් ද කියවෙන්නේ, විශේෂ ඌනතාවක් (Deficiency) පවතින බව යි.

## 4. සෞඛ්‍ය තත්ත්ව

කායික හා මානසික සෞඛ්‍යය සම්බන්ධ විවිධ රෝගී තත්වයන් කෙරෙහි මෙහි දී අවධානය යොමු වේ. අන්ධ බව, ගොළු බව, බිහිරි බව, තදබල අසනීප තත්ත්ව ආදිය ඉගෙනුම සිදු කරන පුද්ගලයාට වෙහෙස ඇතිකරන අතර ඉගෙනුම කෙරෙහි පවත්නා කැමැත්ත ද අඩු කරයි. මානසික සෞඛ්‍යය වශයෙන් අනුගතවීමේ ගැටලු, දූක, කාංසාව, ක්ලමථය හා හීනමාන සංකීර්ණ ආදිය ඉගෙනුම කෙරෙහි බලපායි. කායික වර්ධනය, පෝෂණය, දෘෂ්‍ය හා කායික ඌනතා හා විවිධ ග්‍රන්ථීන්ගේ අසාමාන්‍යතා ද ඉගෙනුමට බලපායි. තයිරොයිඩ් ග්‍රන්ථිය, පිටියුටරි ග්‍රන්ථිය චර්යාව කෙරෙහි විශේෂයෙන් බලපාන අතර ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ඌනතා කියවීම හා ලිවීම සම්බන්ධ දුර්වලතා ඇතිකරයි. පෝෂණය විසින් ඉගෙනුම මෙන් ම කායික වර්ධනය ද තීරණය කෙරේ.[4]

## 5. පරිණතිය

ඉගෙනුම සිදුකරන පුද්ගලයාගේ වර්ධනය මෙයින් කිය වේ. ඉගෙනුම හා පරිණතිය එකට ගමන් කරයි. ඉගෙනුම සිදුවනුයේ කායික හා මානසික පරිණතියට අනුව ය. මාස 06ක දරුවකුට පා පැදියක් පැදිය නො හැකි ය. ඒ සඳහා කායික පරිණතිය අවශ්‍ය කෙරේ. එවැනි දරුවකුගේ ස්නායු ව්‍යුහයන් හා මාංශ තවමත් සූදානම් නැත. සිසුන්ගේ ක්‍රියාකිරීමේ ශක්තිය වර්ධනයට පරිණතිය අවශ්‍ය වෙයි. පරිණතිය විශේෂයෙන් චාලක වර්ධනයට වැදගත් වේ. පරිණතිය ඉගෙනුම ද තීරණය කරයි.

## 6. පෞරුෂය

ඉගෙනුම කෙරෙහි බලපාන පෞරුෂ ගතිලක්ෂණ කිහිපයක් මනෝවිද්‍යාඥයන් විසින් හඳුනා ගනු ලැබ ඇත. එනම් "සිහිය" (Conscientiousness), "විවෘතභාවය" (Openess) හා "න්‍යුරෝෂිය" (Neuroticism) වැනි ලක්ෂණයන් ය. සිහිය සහිත පුද්ගලයෝ කාලය කළමනාකරණය, වෙහෙසී වැඩ කිරීම, පැහැදිලි ඉලක්ක ඇති බව, අභ්‍යන්තරික අභිප්‍රේරණය සහිත බව හා ඉගෙනුම පිළිබඳ ධන ආකල්ප සහිත බව යන ලක්ෂණයන්ගෙන් යුක්ත වෙති. විවෘතභාවය සහිත පුද්ගලයෝ ප්‍රශ්න කිරීමණි විවාද කිරීම, තාර්කික බව, අභ්‍යන්තරික අභිප්‍රේරණය සහිත බව හා විෂය නිර්දේශයෙන් ස්වාධීන වීම යන ලක්ෂණයන්ගෙන් යුක්ත වෙති. න්‍යුරෝෂිය භාවය සහිත පුද්ගලයෝ අවධානය මදිකම, අසමත්වීම සම්බන්ධයෙන් බිය වීම, ඉගෙනුම ක්ලමථකාරි ලෙස දැකීම, තාර්කික හැකියාව මදිකම, බාහිර අභිප්‍රේරණය සහිත බව, විෂය නිර්දේශවලට බැඳුණු ඉගෙනුම් එළඹුමකින් යුක්ත වීම යන ලක්ෂණ සහිත වෙති.

## 7. ලිංගික භාවය

ඉගෙනීම සිදුකරන පුද්ගලයාගේ ලිංගික භාවය (Gender) ද ඉගෙනුම කෙරෙහි බලපායි. ස්ත්‍රී මොළය පිරිමි මොළයට වඩා පරිණත වීම වේගවත් ය. ගැහැණු ළමුයි පිරිමි ළමුන්ට වඩා හොඳින් සන්නිවේදනය කරති. මීට අමතර ව ගුරුවරයාගේ ලිංගික භාවය ද ඉගෙනුම සිදුකරන ගැහැණු හා පිරිමි ළමුන් කෙරෙහි බලපායි. ගැහැණු ළමුන් කාන්තාවන්ගෙන් ද පිරිමි ළමුන් පිරිමින්ගෙන් ද වැඩි වශයෙන් ඉගෙන ගන්නා බව කියවේ. ගැහැණු හා පිරිමි ළමුන්ට පන්ති කාමරවල දී වෙනස් ආකාරයට සළකනු ලැබේ. එය තීරණය වනුයේ ගුරුවරයාගේ ලිංගික භාවය මත ය. සිසුන්ගේ හැකියා පිළිබඳ ගුරුවරයාගේ සංජානනය වෙනස් වනුයේ ද ලිංගික භාවය නිසා ය.



## 8. වයස

වයස (Age) පිළිබඳ වැදගත් කරුණු පරිණතිය යටතේ ද දැක්වේ. මිනිසා උපතේ සිට මරණය දක්වා ම උගනී. එය විධිමත් හෝ අවිධිමත් ඉගෙනුමක් විය හැකි ය. ජීවවිද්‍යාත්මක ව වයසට යත් ම ශරීරය පමණක් නොව ප්‍රජානන හැකියා ද වෙනස් වේ. වයසට යෑමේ ක්‍රියාවලිය නැවැත්විය නො හැකි ය. යෞවනයන් සේ වේගවත් ව ඉගෙනුමෙහි නිරතවීමට වැඩිහිටියන්ට නො හැකි ය. ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ද ඔවුන්ට අවශ්‍ය කෙරේ. මිනිසුන් නිරෝගී ව සිටී නම් ඔවුන්ගේ ඉගෙනුම් හැකියා දුර්වල නොවන බව මනෝවිද්‍යාඥයන්ගේ මතය යි. ඉගෙනුම සඳහා වැදගත් වන කාල පරාසයන් ජීවිතයේ පවත්නා බව ද ඔවුන්ගේ අදහස යි. Lenneberg (1987) ට අනුව භාෂා උපාර්ජනය වෙනුවෙන් වැදගත් කාල පරිච්ඡේදයක් පවත්නා බව කිය වේ. එය "තාර්කික කාලය" (Critical Period) ලෙස දැක්වේ. මෙකල භාෂා ඉගෙනුම වඩාත් සාර්ථක වන අතර ඉන් පසු කාලය එවැනි ඉගෙනුම් අපහසු කරවන බව දැක්වේ. තව ද දෙවන භාෂාවක් ඉගෙනීමේ දී වයස බලපාන බව Collier (1988) ද පවසයි.

## 9. ආකල්ප

"ආකල්ප" (Attitudes) යනු දකින විදිය හෝ අගයන විදිය යි. ඉගෙනුමට සම්බන්ධ පුද්ගලයන්, ස්ථාන, විෂයන් හා විභාග කෙරෙහි ආකල්ප පවතී. ධන ආකල්ප ඉගෙනුම වර්ධනය ද ඍණ ආකල්ප ඉගෙනුම දුර්වල කරයි. ගුරුවරයා සම්බන්ධ ආකල්ප ධනාත්මක වන විට ඔහුගෙන් ඇයගෙන් ඉගෙනීමට ළමයි කැමති වෙති. එහි අනෙක් පැත්ත වනුයේ ඍණ ආකල්ප යමකින් ඉවත්වීමට හේතු වීම ය. ජනප්‍රිය පාසැල්, ජනප්‍රිය ගුරුවරුන්, ජනප්‍රිය පන්ති ආදිය සොයායනුයේ එබැවිනි. සමහර පාසැල්වලින් ළමුන් ඉවත් කරගනුයේ ද ආකල්ප ඍණ වීම නිසා ය. ධන ආකල්ප ඇති විෂයන් ඉගෙනුමට ළමුන් යොමු වේ. විභාග සම්බන්ධ ධන ආකල්ප ඇතිවිට බොහෝ වෙහෙසී සූදානම් වේ.

## 10. ස්ව-සංකල්පය

ස්ව-සංකල්පය (Self-Concept) යනු තමා පිළිබඳ අවබෝධය යි. එය ද ඉගෙනුම කෙරෙහි බලපාන ඉගෙනුම සිදුකරන පුද්ගලයාට අදාල ප්‍රබල සාධකයකි. ඉගෙනුම් සාර්ථකත්වයට ඉහළ හෝ මනා ස්ව- සංකල්පයක් පැවතීම අවශ්‍ය කෙරේ. ස්ව-සංකල්පය දුර්වල වන විට ඉගෙනුම ද දුර්වල වේ. Moris D. Caplin (1969) ට අනුව ශාස්ත්‍රීය සාධනය (Academic Achievement) හා ස්ව-සංකල්පය අතර සැලකිය යුතු ධන සම්බන්ධතාවක් පවතී. ඔහු ඉහළ ස්ව-සංකල්පයක් සහිත දරුවන්ට ඉහළ ශාස්ත්‍රීය සාධනයක් පැවැති බව කියයි. Nunez සහ Gonzalez-Pienda (1995) දෙදෙනාට අනුව ස්ව-සංකල්පය හා ශාස්ත්‍රීය ක්‍රියාකාරිත්වය අන්‍යෝන්‍ය වශයෙන් බලපායි. ශාස්ත්‍රීය ක්‍රියාකාරිත්වය (Academic Performance) ස්ව සංකල්පය තීරණය කරයි. ස්ව-සංකල්පයේ මට්ටම ශාස්ත්‍රීය ක්‍රියාකාරිත්වයේ මට්ටම තීරණය කරයි.[11]

Manning (2006) ඇතුලු පිරිසට අනුව ශාස්ත්‍රීය ස්ව-සංකල්පය (Academic Self Concept) පාසැල තුළ සිසුන් කොපමණ හොඳින් වැඩ කරන්නේ ද යන්න තීරණය කෙරෙන බව කිය වේ. ශාස්ත්‍රීය ස්ව- සංකල්පය යනු සිසුන් තම ශාස්ත්‍රීය හැකියාව (Academic Ability) දකින ආකාරය යි. ඒ අනුව සිසුන්ගේ ශාස්ත්‍රීය ස්ව-සංකල්පය වර්ධනයට ක්‍රියා මාර්ග ගැනීම ගුරුවරුන්ගේ මෙන් ම දෙමාපියන්ගේ ද කාර්යභාරය විය යුතු ය.

## 11. පැහැදිලි කිරීමේ ශෛලිය

පැහැදිලි කිරීමේ ශෛලිය (Explanatory Style) යන්නෙන් අදහස් වනුයේ, විවිධ සිදුවීම් පැහැදිලි කිරීමේ උත්සාහයන් ය. තවත් ආකාරයකට පවසතොත් යම් යම් සිදුවීම් ඇතිවීම පිළිබඳ හේතු කීම් හෝ හේතු දක්වීම් ය. ඉගෙනුමට අදාල සිදුවීම්, අද්දැකීම් හෝ අවස්ථා සම්බන්ධයෙන් ද ළමුන්ට පැහැදිලි කිරීමේ



16 OCT 2017
පුස්තකාලය

නැඹුරුතා පවතී. ඒ ශෛලීන්ගේ ස්වරූප ඉගෙනුම කෙරෙහි යහපත් හෝ අයහපත් ආකාරයට බලපායි. Fritz Heider (1958) මෙම හේතු කීමේ නැඹුරුතාව පිළිබඳ න්‍යායක් ගොඩනැගුවේ ය. එය "හේතු කීමේ න්‍යාය" (Theory of Attribution) නම් වේ. ඊට අනුව හේතු කීමේ ස්වරූප 02 ක් කිය වේ.

1. අභ්‍යන්තරික හේතු කීම් (Internal Attributions) - සිදුවීම් සඳහා වන හේතු අභ්‍යන්තරික ලක්ෂණ කෙරෙහි පැවරීමේ ක්‍රියාවලිය යි. මිනිසා අන්‍යයන්ගේ චර්යාව පැහැදිලි කිරීමේ දී පෞරුෂ ගතිලක්ෂණ වැනි අභ්‍යන්තරික හේතුවලට යොමු වෙයි.
2. බාහිර හේතු කීම් (External Attributions) - පුද්ගලයාගෙන් බාහිර වූ දේවල් හේතු ලෙස දැකීම යි. අපගේ ම චර්යාව පැහැදිලි කිරීමේ දී බාහිර හේතුවලට යොමු වේ.

සිසුන්ට ද හේතු සම්බන්ධ විශ්වාස පවතී. සාධනය සම්බන්ධ සිදුවීම් ඇතිවීමේ දී ඒ සිදුවීම් අනපේක්ෂිත වන විට සිදුවී ඇති දෙය අවබෝධ කරගැනීම සඳහා හේතු සෙවීමේ ගමනක සිසුන් නිරත වන බව හෙයිඩර් පවසයි. යම් සිදුවීමක හේතුව වශයෙන් සිසුන් සංජානනය කරනු ලබන ඕනෑ ම සාධකයක් ඒ සිදුවීම සඳහා නැවත යොමු වන්නේ ද යන්න කෙරෙහි බලපායි. විභාගය අසමත් වීම සඳහා හේතු වශයෙන් හඳුනා ගනු ලබන කරුණු විභාගය සඳහා නැවත පෙනී සිටීම කෙරෙහි බලපායි.

හේතු කීමේ මාන (Dimentions) 03 ක් ඇති බව හෙයිඩර් කියයි. එනම් "පථය" (Locus), "ස්ථාවරතාව" (Stability) හා "පාලනය කළ හැකි බව" (Controllability) වශයෙනි. පථය නමැති මානය යනු සිද්ධියේ හේතුව අභ්‍යන්තරික හෝ බාහිර ලෙස සංජානනය කරන්නේ ද යන්න ය. විභාගය අසමත් වූයේ හැකියාව මදිකම නිසා යැයි විශ්වාස කරන්නේ නම් එය "අභ්‍යන්තරික හේතු" තෝරාගැනීම කි. එය සිදුවූයේ ගුරුවරයාගේ අදක්ෂතාව නිසා යැයි විශ්වාස කරන්නේ නම් එය

16 OCT 2017



"බාහිර හේතු" තෝරාගැනීම කි. ස්ථාවරතා මානය යනු හේතුව ස්ථාවර ද අස්ථාවර ද යන්න යි. විභාගය අසමත් වූයේ "හැකියාව" නැති නිසා යැයි විශ්වාස කරන්නේ නම් එය "ස්ථාවර හේතුව" කි. එය වෙනස් කළ නො හැක. එමෙන් ම එය සිදුවූයේ විභාග කාලයේ තමා අසනීප වී සිටි නිසා යැයි විශ්වාස කරන්නේ නම් එය "අස්ථාවර හේතුව" කි. අසනීපය තාවකාලික ය. පාලනය පිළිබඳ මානය යනු සිදුවීමක හේතුව පුද්ගලයාට පාලනය කළ හැකි ද නැද්ද යන්න යි. විභාගය අසමත් වූයේ සූදානම් වීමේ මදිකම නිසා යැයි විශ්වාස කරන්නේ නම් ඒ හේතුව පාලනය කළ හැක්කකි. හැකියාව නැතිකමෙන් අසමත් වූ බවට විශ්වාස කරන්නේ නම් එය පාලනය කළ නොහැකි හේතුව කි. අභ්‍යන්තරික හේතු පාලනය කළ හැකි ඒවා ය. ශාස්ත්‍රීය ඵලයන් සඳහා හේතු වශයෙන් උත්සාහය, ඉගෙනුම් උපායයන් වැනි හේතු දැක්වීම ශාස්ත්‍රීය සාධනය වර්ධනයටත් වාසනාව, හැකියාව මදිකම හෝ තදබල අසනීප වැනි හේතු දැක්වීම ශාස්ත්‍රීය සාධනය දුර්වල වීමටත් මගපාදන බව හෙයිඩර් කියයි.

## සමාලෝචනය

ඉගෙනුම්කරුගේ විවිධ කායික හෝ මනෝවිද්‍යාත්මක තත්ත්ව ඉගෙනුම කෙරෙහි බලපාන පුද්ගල බද්ධ සාධක වශයෙන් සලකනු ලැබේ. මෙම තත්ත්ව හෝ සාධක කාලීන ව වෙනස් විය හැකිය. කෙසේ වුව ද ඉගෙනුම කෙරෙහි මේ සාධක යහපත් ආකාරයකට පවත්වාගැනීම අවශ්‍ය කෙරේ. විශේෂයෙන් ඉගෙනුම්කරු සම්බන්ධ මනෝවිද්‍යාත්මක හෝ චිත්තවේගික සාධක බාහිරට දක්නට නොලැබුණ ද ඉගෙනුම කෙරෙහි ප්‍රබල භූමිකාවක් ඉටුකරයි. එබැවින් භෞතික හා මානසික සාධක සියල්ල සම්බන්ධ සැලකිලිමත් බව අවශ්‍ය කෙරේ. එය ඉගෙනුම වර්ධනයට හා සාර්ථකත්වයට වැදගත් වෙයි.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. විජේතුංග, ස්වර්ණා., (2013), *අධ්‍යාපන මනෝවිද්‍යාව*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
2. Chauhan, S.S. (2007), *Advanced Educational Psychology*, $7^{th}$ Ed, Vikas; New Delhi.
3. Coon, Dennis., (2003), *Essentials of Psychology*, $9^{th}$ Ed, Thomson Wadsworth; NewYork.
4. Ekman, Paul., (2003), *Emotions Revealed, Understanding Faces and Feelings*, Phoenix; USA.
5. Goleman, Daniel., (1999), *Working with Emotional Intelligence*, Bloomsdury; USA.
6. Hardeep Kaur Shergill, (2012), *Experimental Psychology*, PHI Learning; New Delhi.
7. James W. Kalat, (2005), *Introduction to Psychology*, $7^{th}$ Ed, Wadsworth; USA.
8. John W. Santrock, (2006), *Educational Psychology*, $2^{nd}$ Ed, McGraw Hill; New Delhi.
9. Robert J. Sternberg, (2009), *Cognitive Psychoology*, $5^{th}$ Ed, Wadsworth; USA.
10. Robert S. Feldman, (2004), *Understanding Psychology*, $6^{th}$ Ed, McGraw Hill; New Delhi.
11. Spinnks, Tony & Clements, Phil, (1999), *Facilitating Learning*, Viva Books; New Delhi.